රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 7/91

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07.
1991 පෙබරවාරි මස 23 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් සභා
රාජ්‍ය සේවා කොමිෂන් සභාවල ලේකම්වරුන්,

## ත්‍රස්තවාදය බලපැවැත්වෙන ප්‍රදේශවල රජයේ නිලධාරීන්ට දිරි දීමනා ගෙවීම.

1986.12.11 දින දරණ අංක. 357, 1989.08.14 දින දරණ අංක. 40/89, 1989.09.26 දින දරණ අංක. 46/89 සහ 1990.10.12 දින දරණ අංක. 42/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වෙත ඔබගේ අවධානය යොමු කරමි.

02. ඉහත සඳහන් චක්‍රලේඛවල දක්වා ඇති ක්‍රමයන්ට අනුව රාජ්‍ය නිලධාරීන්ට ඉහත සඳහන් දිරිදීමනා ලැබීමට හිමිකම් තිබුනද ඇතැම් ආයතන විසින් මූල්‍යමය අපහසුතාවය නිසා එබඳු නිලධාරීන්ට එම දිරිදීමනා ගෙවා නොමැති බව පෙන්වා දී ඇත. සේවා ස්ථානය විවෘතව තැබුනේ නම් සහ ඇත්ත වශයෙන්ම නිලධාරීන් සේවයට වාර්තා කොට තිබුන බවට ස්ථිර සාක්ෂි ඇත්නම් එසේ දිරිදීමනා හිමි එහෙත් එම දීමනා ගෙවා නොමැති එබඳු නිලධාරීන්ට 1988.01.01 සිට ක්‍රියාත්මක වන පරිදි එම දීමනා ගෙවීම සඳහා අරමුදල් භාණ්ඩාගාරය විසින් ලබා දිය යුතු යැයි රජය විසින් තීරණය කර ඇත.

03. දිස්ත්‍රික්කයේ සේවය කරන නිලධාරීන්ට ලබා දෙන ලද විශේෂ නිවාඩු ඇතුළුව නිලධාරීන් ලබා ගන්නා ලද නිවාඩු අනුව සමානුපාතිකව දීමනාව අඩු කළ යුතුය. කෙසේ වුවද, අදාළ ආයතන එම කාලපරිච්ඡේදය තුල ක්‍රියාත්මක නොවූයේ නම් මෙම දීමනාව ගෙවන නොලැබේ.

04. 1989.08.14 දින අංක. 40/89 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අවසන් වාක්‍යය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, පහත සඳහන් වාක්‍යය ඒ වෙනුවට ආදේශ කරන ලැබේ.

"ආරක්ෂක අමාත්‍යාංශය විසින් ත්‍රස්තවාදය බලපැවැත්වෙන ප්‍රදේශ වශයෙන් තීරණය කරන ලද දිනය හෝ 1988.01.01 දිනය හෝ යන මෙම දිනයන් දෙකින් පසුව එළඹෙන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවීම් කළ යුතුය. ත්‍රස්තවාදය බලපවත්වන ප්‍රදේශයක ස්ථිරව පදිංචිව සිටි නමුත් ත්‍රස්තවාදය බල නොපවත්වන ප්‍රදේශයක සේවය කරන නිලධාරියෙකුට මෙම දිරිගැන්වීම් ලැබීම සඳහා හිමිකම් නොමැත."

05. අංක. 61/89 හා 1989.12.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් 1990.01.01 දින සිට බලපවත්වන පරිදි මෙම යෝජනා ක්‍රමය යටතේ වන ගෙවීම් නතර කර ඇති බව කරුණාකර සටහන් කරගනු මැනවි.

**06.** මෙම චක්‍රලේඛයේ කාර්යයක් සඳහා "රාජ්‍ය නිලධාරියා" යන යෙදුමෙන් අදහස් කරන්නේ ආයතන සංග්‍රහයේ 1 පරිච්ඡේදය අනුව "නිලධාරියා" යන්න පිළිබඳ අර්ථ නිරූපනය වේ.

අ.කළේ./(ආර්. අබේරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

පිටපත්:-

1. භා.නි. /ලේ.
2. රාජ්‍ය සංස්ථාවල, සම්පූර්ණයෙන්ම රජය සතු සමාගම්වල, රජයට පවරාගත් ව්‍යාපාරික ආයතනවල නිසි බලධාරීන්/ සභාපතිවරුන් වෙත - දැ.ස.
3. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් - දැ.ස.